අග්‍රාමාත්‍ය කාර්යාලය

பிரதம அமைச்சர் அலுவலகம்

Prime Minister's Office



# කාර්යසාධන වාර්තාව

# செயலாற்றுகை அறிக்கை

# Perfomance Report 2013

# අපගේ දැක්ම

ස්වාධීන, ස්වෛරී හා
සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක්

# අපගේ මෙහෙවර

ශ්‍රී ලාංකීය ජනතාවගේ අපේක්ෂාවන් මල්ඵල
ගැන්වීම පිණිසත්,
ඔවුන්ගේ ජීවන තත්ත්වය නංවාලීම පිණිසත්,
රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන අතර මනා
සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින්,
යහ පාලනයෙන් යුත් විශිෂ්ට රාජ්‍ය
යාන්ත්‍රණයක් උදෙසා අවැසි නායකත්වයක් සැපයීම.

# පටුන

1. වගකීම් සහ කාර්යභාරය

2. අග්‍රාමාත්‍ය කාර්යාලයේ සංවිධාන ව්‍යුහය

3. අග්‍රාමාත්‍ය කාර්යාලයේ පරිපාලන ව්‍යුහය

4. අග්‍රාමාත්‍ය කාර්යාලය - කාර්ය මණ්ඩලය

5. ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති හා වැඩසටහන්

   i. මහින්ද චින්තන ඉදිරි දැක්ම ජාතික ප්‍රතිපත්තියට සමගාමීව ගරු අග්‍රාමාත්‍යතුමාගේ සංකල්පයක් අනුව ක්‍රියාත්මක වන "ආර්ථික සංවර්ධනයත් සමග උත්තරීතර සමාජයක් උදෙසා ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ යහපත් ආකල්ප වර්ධනය කිරීමේ" වැඩසටහන

   ii. 2008 වසරේ සිට ක්‍රියාත්මක වන ඵලදායිතා සංවර්ධන වැඩසටහන

   iii. දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමී වැඩසටහන්

   iv. 2008 වසරේ සිට පුරවැසි සේවා ප්‍රඥප්තියක් තුළින් සමාජ සේවාවන් පිළිබඳව දැනුවත් කිරීම හා සේවා සැපයීම කාර්යක්ෂම කිරීම

   v. 2008 – 2015 සාක් සමාජ ප්‍රඥප්තිය හා සම්බන්ධ ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධීකරණය කිරීම

6. ගරු අග්‍රාමාත්‍යතුමා නිරත වූ විදේශීය සංචාර, රාජ්‍ය තාන්ත්‍රිකයන් හමුවීම/සාකච්ඡා/ගිවිසුම්

7. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හා රාජ්‍ය නිලධාරීන්ට සමුළු/ සම්මන්ත්‍රණ/ වැඩමුළු/ ශිෂ්‍යත්ව සඳහා දිවයිනෙන් බැහැරව යාමට අනුමැතිය ලබාදීම

8. අමාත්‍ය මණ්ඩල සංදේශ, පාර්ලිමේන්තු වාර්තා හා පනත් කෙටුම්පත් ආදිය පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම හා පාර්ලිමේන්තු ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම

9. තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධනය

10. මානව සම්පත් සංවර්ධනය

11. 2013 වසර සඳහා වියදම් වාර්තාව

# 1) වගකීම් සහ කාර්යභාරය

අග්‍රාමාත්‍ය කාර්යාලය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍යතුමාගේ නිල රාජකාරි කටයුතු ක්‍රියාත්මක කරන ආයතනයයි. එමගින් ඉටුවන කටයුතු පහත සඳහන් පරිදි වර්ග කර දැක්විය හැකිය.

- ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවාව තුළ දෙවන ප්‍රධානතම කාර්යාලය වශයෙන් අනෙකුත් සියලුම රාජ්‍ය ආයතනවලට අවශ්‍ය මග පෙන්වීම් ලබාදීම.
- ගරු අග්‍රාමාත්‍යතුමා මුලසුන හොබවන විවිධ කමිටු හා රැස්වීම් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම හා සම්බන්ධීකරණය
- රාජ්‍ය අංශයේ සියලුම අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කර ගනිමින් මහජනතාවට ප්‍රශස්ත සේවාවක් සැපයීම
- ගරු අග්‍රාමාත්‍යතුමා හට විදේශ දූත මණ්ඩල, විදේශ තානාපති සේවයේ නිලධාරීන් සමඟ සම්බන්ධතා පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සළසා දීම.
- පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු ලබාදීම, රජයේ ප්‍රතිපත්ති සහ තීරණ ක්‍රියාවට නැංවීමට පූර්ණ සහය ලබාදිම.
- ගරු අග්‍රාමාත්‍යතුමා මගින් යොමු කරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත්වලට සම්බන්ධ කටයුතු ඉටු කිරිම.
- දකුණු ආසියාතික කලාපයේ සමාජ ප්‍රඥප්තියේ ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධ කටයුතු නියාමනය කිරිම හා පසු විපරම් කිරිම.
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හා රාජ්‍ය නිලධාරීන්හට විවිධ කටයුතු සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව යාම සඳහා ගරු අග්‍රාමාත්‍යතුමාගේ අවසරය ලබාදීම.
- ගරු අග්‍රාමාත්‍යතුමාගේ විදේශ සංචාර සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය හා මෙහෙයවීම.
- ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගීවන රාජ්‍ය හා ජාතික උත්සව සහ විශේෂ අවස්ථා සඳහා මාධ්‍ය ආවරණ කටයුතු ඉටු කිරිම.
- අග්‍රාමාත්‍ය කාර්යාලයට අදාළ පරිපාලන හා සංවර්ධන කටයුතු ඉටු කිරිම.
- නිලධාරීන් පුහුණු කිරිම හා දිරි ගැන්වීමේ වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරිම.
- අග්‍රාමාත්‍ය කාර්යාලය, ගරු අග්‍රාමාත්‍යතුමාගේ නිල නිවාස සහ සංචාරක බංගලා ආදියේ නඩත්තු කටයුතු
- විවිධ සමාජ සත්කාරක සේවාවන් සඳහා අවශ්‍ය දායකත්වය ලබාදීම.
- ආර්ථික සංවර්ධනයත් සමග උත්තරීතර සමාජයක් උදෙසා ශ්‍රී ලාංකේය ජනසමාජය තුළ යහපත් ආකල්ප වර්ධනය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරිම.

# 2) අග්‍රාමාත්‍ය කාර්යාලයේ සංවිධාන සටහන



## 3) අග්‍රාමාත්‍ය කාර්යාලයේ පරිපාලන ව්‍යුහය

- ගරු අග්‍රාමාත්‍යතුමාගේ කාර්යාලය
- අග්‍රාමාත්‍ය පෞද්ගලික කාර්ය මණ්ඩලය
- අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය
- අග්‍රාමාත්‍ය අතිරේක ලේකම් කාර්යාලය
- පාලන අංශය
- ගිණුම් අංශය
- සංවර්ධන අංශය
- මාධ්‍ය අංශය
- සැපයුම් හා ගබඩා අංශය
- ප්‍රවාහන අංශය
- ආරක්ෂක අංශය

## 4) අග්‍රාමාත්‍ය කාර්යාලය - කාර්ය මණ්ඩලය

### 2013.12.31 දිනට ස්ථිර කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුරු නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | අග්‍රාමාත්‍ය ලේකම් | 1 | 1 | 0 |
| 2 | අතිරේක ලේකම් | 1 | 1 | 0 |
| 3 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 2 | 2 | 0 |
| 4 | සහකාර ලේකම් | 7 | 5 | 2 |
| 5 | ගණකාධිකාරි | 1 | 1 | 0 |
| 6 | ගණකාධිකාරි(අභ්‍යන්තර විගණක) | 1 | 1 | 0 |
| 7 | සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශ්‍රී ලං.සැ.සේ.) | 1 | 1 | 0 |
| 8 | පරිපාලන නිලධාරි | 1 | 1 | 0 |
| 9 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුර | 1 | 0 | 1 |
| 10 | භාෂා පරිවර්තක | 2 | 2 | 0 |
| 11 | ප්‍රලේඛන නිලධාරි | 1 | 0 | 1 |
| 12 | සන්ධාන නිලධාරි | 1 | 1 | 0 |
| 13 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 42 | 40 | 2 |
| 14 | රූපවාහිනී කැමරාකරු | 1 | 1 | 0 |
| 15 | රූපවාහිනී කාර්මික ශිල්පී | 1 | 0 | 1 |
| 16 | පිළිගැනීමේ නිලධාරි | 1 | 0 | 1 |
| 17 | පොත් බැඳුම්කරු | 1 | 1 | 0 |
| 18 | දුරකථන ක්‍රියාකරු | 2 | 2 | 0 |
| 19 | රූපවාහිනී සේවා සහායක | 2 | 2 | 0 |
| 20 | මෝටර් රථ රියදුරු | 26 | 26 | 0 |
| 21 | ප්‍රධාන කා.කා.සහායක | 1 | 1 | 0 |
| 22 | කාර්යාල සේවක සේවය | 34 | 34 | 0 |
| | **එකතුව** | **131** | **123** | **8** |

# පෞද්ගලික කාර්ය මණ්ඩලය
## 2013.12.31 දිනට

| අනු අංකය | තනතුරු නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | පෞද්ගලික ලේකම් | 1 | 1 | 0 |
| 2 | මහජන සම්බන්ධතා ලේකම් | 1 | 1 | 0 |
| 3 | සම්බන්ධීකරණ ලේකම් | 1 | 1 | 0 |
| 4 | මාධ්‍ය ලේකම් | 1 | 1 | 0 |
| 5 | සම්බන්ධීකරණ ලේකම් (වෘත්තීය සමිති) | 1 | 1 | 0 |
| 6 | සම්බන්ධීකරණ ලේකම් (පාර්.කටයුතු) | 1 | 1 | 0 |
| 7 | පුද්ගලික සහකාර | 1 | 1 | 0 |
| 8 | ලඝු ලේඛක (ඉංග්‍රීසි/දෙමළ) | 2 | 2 | 0 |
| 9 | ලඝු ලේඛක (සිංහල) | 2 | 2 | 0 |
| 10 | යතුරු ලේඛක (සිංහල) | 3 | 3 | 0 |
| 11 | යතුරු ලේඛක (ඉංග්‍රීසි) | 2 | 2 | 0 |
| 12 | ලිපිකරු | 9 | 9 | 0 |
| 13 | රියදුරු | 9 | 9 | 0 |
| 14 | කාර්යාල කාර්ය සහායක | 4 | 4 | 0 |
| | **එකතුව** | **38** | **38** | **0** |

# තාවකාලික කාර්ය මණ්ඩලය
## 2013.12.31 දිනට

| අනු අංකය | තනතුරු නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | උපදේශක (විදේශ කටයුතු) | 1 | 0 | 1 |
| 2 | උපදේශක (ගරු අග්‍රා. හා ගරු බුද්ධ ශාසන ඇමතිතුමාගේ) | 1 | 1 | 0 |
| 3 | අග්‍රාමාත්‍ය ලේකම්ගේ සම්.ලේකම් | 1 | 1 | 0 |
| 4 | අරලියගහ මන්දිරයේ කළමනාකරු | 1 | 0 | 1 |
| 5 | සමාජ සහකාර | 1 | 1 | 0 |
| 6 | පෞද්ගලික ආරක්ෂක | 5 | 5 | 0 |
| 7 | ප්‍රවෘත්ති නිලධාරී | 1 | 1 | 0 |
| 8 | මාධ්‍ය සම්බන්ධීකාරක | 1 | 1 | 0 |
| 9 | ප්‍රවෘත්ති සංස්කාරක | 2 | 2 | 0 |
| 10 | ඡායාරූප ශිල්පී | 1 | 1 | 0 |
| 11 | උපදේශක වෙද්(අරලියගහ මන්දිරය) | 1 | 0 | 1 |
| 12 | ප්‍රධාන අරක්කැමි | 1 | 1 | 0 |
| 13 | බංගලා භාරකරු | 3 | 3 | 0 |
| 14 | සහකාර බංගලා භාරකරු | 2 | 2 | 0 |
| 15 | අරක්කැමි (නුවරඑළිය) | 1 | 1 | 0 |
| 16 | නිල නිවාස සහායක | 8 | 8 | 0 |
| 17 | ගෘහ සේවක | 2 | 2 | 0 |
| 18 | සංග්‍රහ කටයුතු සහ ගොඩනැගිලි නඩත්තු භාරකරු | 1 | 1 | 0 |
| 19 | රිය ශෝධක | 2 | 2 | 0 |
| | **එකතුව** | **36** | **33** | 3 |

## 5) ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති සහ වැඩසටහන්

### (i) "මහින්ද චින්තන ඉදිරි දැක්ම" ජාතික ප්‍රතිපත්තියට සමගාමීව ගරු අග්‍රාමාත්‍යතුමාගේ සංකල්පයක් අනුව ක්‍රියාත්මක වන ආර්ථික සංවර්ධනයත් සමග උත්තරීතර සමාජයක් උදෙසා ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ යහපත් ආකල්ප වර්ධනය කිරීමේ වැඩසටහන

**හැඳින්වීම**

මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත් කිරීමේ මූලික සංකල්පය හා අනුගතවෙමින් සීඝ්‍ර ආර්ථික සංවර්ධනයත් සමග සමාජ සංවර්ධනයක අවශ්‍යතාව පැන නැගී ඇත. රට පිටිවහලක් සපයමින් ආර්ථික සංවර්ධනයත් සමග උත්තරීතර සමාජයක් උදෙසා ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ යහපත් ආකල්ප වර්ධනය කිරීමේ වැඩසටහන අග්‍රාමාත්‍ය කාර්යාලය මගින් දැනටමත් ආරම්භ කර ඇත. ඒ අනුව විවිධ තේමාවන් මුල් කරගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

**සංකල්පය**

මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් පරිදි මිනිසා භෞතික වශයෙන් පමණක් නොව ආධ්‍යාත්මික වශයෙන්ද ගොඩනැගීම සඳහා ශ්‍රද්ධාව මෙන්ම, ප්‍රඥාවද ලබාදිය යුතුය. මේ සඳහා මාපිය-දූදරු, සැමියා-බිරිඳ, ගුරු-සිසු, සේව්‍ය-සේවක, පාලක-පාලිත, ආදී සියලුම සබඳතා යහපත් සහ එළදයි ඒවා බවට පත්කර අසහනය හා අවිශ්වාසය හදවත් තුළින් ඉවත් කළ යුතුය. එමගින් ආර්ථික සංවර්ධනයට සමගාමීව සමාජ සංවර්ධනයක් ද ඇති කර සුරක්ෂිත සමාජයක් රට තුළ ගොඩනැගීම අපේක්ෂා කෙරේ.

**අරමුණු**

- ජාතිකාභිමානිය හැගිම් ගොඩ නැංවීම
- පරිසරය සමග සහජීවනයෙන් කටයුතු කිරීම
- ස්වයං විනයක් සහිත සමාජයක් බිහිකිරීම

## යහපත් ආකල්ප  වර්ධන වැඩසටහන යටතේ  ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්

❖ දැයට කිරුළ ප්‍රදර්ශනය හා සමගාමිව අම්පාර දිස්ත්‍රික්කයේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර යහපත් ආකල්ප වර්ධනය කිරිම යන තේමාව යටතේ රචනා හා චිත්‍ර තරගයක් පවත්වන ලදි.




❖ යහපත් සිතක් - සව්මත් රටක් තේමාවෙන් යුක්ත අග්‍රාමාත්‍ය කාර්යාලය මගින් මෙහෙයවනු ලබන යහපත් ආකල්ප වර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ළමා පරපුර වෙත යහපත් ගුණධර්ම වර්ධනය කර ගැනීම පිළිබඳ දැනුම හා අවබෝධය ලබාදීමේ අරමුණින් යහපත් වැඩිහිටි දිවියකට අත්වැල සපයන විනයගරුක යහපත් ළමාවියක් පවත්වා ගැනීමට අවැසි උපදෙස් ඇතුලත් ළමා අත්පොතක් **“දෝත පුරා ඔවදන් මල්”** නමින් ප්‍රවීණ චිත්‍ර ශිල්පිණී හා ලේඛිකා සිබිල් වෙත්තසිංහ මහත්මිය මගින් නිර්මාණය කරන ලදී.



❖ සෝමවීර සේනානායක මහතා විසින් රචිත යහපත් සිතක් - සව්මත් රටක් යන සිංහල මාධ්‍යයෙන් සම්පාදිත ග්‍රන්තයේ පළමු මුද්‍රණය රජයේ සියලුම පාසල් වලට නොමිලයේ බෙදාහැරීමට කටයුතු කරමින් පවතී.




❖ යහපත් සිතක් - සව්මත් රටක් යන තේමාව යටතේ සෝමවීර සේනානායක මහතා විසින් රචිත කෘතියෙහි දෙමළ භාෂා අනුවර්තනය ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරමින් පවතින අතර එය දෙමළ සිසුන් සිටින පාසල් වලට නොමිලයේ බෙදාහැරීමට සැලසුම් කර ඇත.

❖ පුවත්පත් කාටුන් කලාව නව මං පෙතකට යොමු කරමින් කාටුනයක් තුළින් ජන සමාජයේ යහපත් වෙනසක් ඇති කිරීමේ පුරෝගාමීත්වය ලබා කුඩා දරුවන් වෙනුවෙන් විජය පුවත්පත හරහා මේ වනවිටත් කුඩා දරුවන්ගේ යහපැවැත්ම උදෙසා පණිවුඩ ගෙනයනු ලබයි.




❖ මන්නාරම දිස්ත්‍රික්කයේ දුෂ්කර පාසැල් හඳුනාගෙන එම සිසු සිසුවියන්ගේ යහපත් ආකල්ප වර්ධනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කල අතර එම දරු දැරියන් සහ ගුරුවරුන් වෙනුවෙන් පාසල් උපකරණ සහ ශබ්ද කෝෂ ඇතුළු වටිනා පොත් පත් පරිත්‍යාග කරන ලදී.

❖ එදිනෙදා ජීවිතයේ දැන හෝ නොදැන අප අතින් සිදුවන වැරදි, අඩුපාඩු, අතපසුවීම් නිවැරදි කර ගැනීමට මග පෙන්වන ගුවන් විදුලි මාධ්‍යයේ ප්‍රචාරය කෙරෙන " ජීවිතයට විනාඩියක් " වැඩසටහන ජාතික ගුවන් විදුලියේ වෙළඳ සේවය, නෙත් එෆ්.එම්. ගුවන් විදුලිය හා රන් එෆ්.එම්. ගුවන් විදුලිය ඔස්සේ මේ වන විට ප්‍රචාරය වෙමින් පවතී.

## යහපත් ආකල්ප වර්ධන වැඩසටහන වෙනුවෙන් දරන ලද වියදම

| වර්ෂය | ඇස්තමේන්තු මුදල | වියදම (රු) |
|---|---|---|
| 2010 | 400,000 | 399,858 |
| 2011 | 20,330,000 | 20,216,513 |
| 2012 | 35,400,000 | 25,694,916 |
| 2013 | 30,000,000 | 21,030,370 |



## (ii) 2008 වසරේ සිට ක්‍රියාත්මක වන අග්‍රාමාත්‍ය කාර්යාලයේ ඵලදායිතා සංවර්ධන වැඩසටහන 2013 වසරේදී තවදුරටත් ක්‍රියාත්මක කෙරිණි.

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද ඵලදායිතා සම්මාන – 2009 තරගාවලියේ රාජ්‍ය අංශයේ අන්තර් අමාත්‍යාංශ කාණ්ඩය යටතේ ඉදිරිපත් වී විශේෂ කුසලතා සම්මාන සහතිකයක් අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් දිනා ගැනීමෙන් අනතුරුව ඊළඟ පියවර වශයෙන් පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී.

1. කාර්ය මණ්ඩලය තුළ ආකල්පමය වෙනසක් ඇති කොට ඒ තුළින් කාර්යාල පරිසරය හා බාහිර සබඳතා ඉහල මට්ටමකට ගෙන ඒම සඳහා පුහුණු වැඩසටහන් වලට යොමු කිරීම..
2. තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් දැනට ක්‍රියාත්මක ක්‍රියාදාමයන් යාවත්කාලීන කිරීමට හා කාර්යක්ෂම කිරීමට කටයුතු කිරීම.
3. කාර්යාලය තුළ වැඩමුළු පැවැත්වීම මඟින් තත්ත්ව කව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික දැනුම හා ශිල්ප ක්‍රම පිළිබඳ දැනුමක් ලබා දී ඇත.
4. සේවා ඵලදායීතාවය වර්ධනය කිරීම සඳහා කාර්ය මණ්ඩලයට ඵලදායිතා පුහුණු අවශ්‍යතා සලසා දෙනු ලැබ ඇත.

## (iii) දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමී වැඩසටහන්

වාර්ෂිකව ජාතික නිදහස් දිනට සමගාමීව පැවැත්වෙන දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය 2013 මාර්තු මස අම්පාර දිස්ත්‍රික්කයේ දී පැවැත් විය. ඒ අනුව, මෙම ප්‍රදර්ශනයට අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රදර්ශන මණ්ඩපය නිර්මාණය කිරීම හා විවිධ වැඩසටහන් දියත් කෙරිණි.

තවද, 2014 වර්ෂයේ දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනය මුල් කරගෙන යහපත් ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පුස්තකාල පහසුකම් නොමැති පාසල් 30ක් තෝරාගෙන එම පාසල් වලට පුස්තකාලයක් ආරම්භ කිරීම සඳහා පොත් සහ කබඩ් ලබාදීමේ වැඩසටහන මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතී. තවද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා දිස්ත්‍රික් මට්ටමින් පාසල් ළමුන් අතර චිත්‍ර තරග පවත්වා දැයට කිරුළ ප්‍රදර්ශන උත්සවයේ දී ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ජයග්‍රාහක දරු දැරියන් වෙත තෑගි සහ සහතික පත් ප්‍රදානය කිරීමට ද සැලසුම් කර ඇත.

## (iv) 2008 වසරේ සිට පුරවැසි සේවා ලාභී ප්‍රඥප්තියක් තුළින් සමාජ සේවාවන් පිළිබඳව දැනුවත් කිරීම හා සේවා සැපයීම කාර්යක්ෂම කිරීම

**අරමුණ**

- මේ තුළින් රාජ්‍ය සේවාවන් සැපයෙන ක්‍රමයන්හි ගුණාත්මක බව අඛණ්ඩව ඉහළ නැංවීම.
- සැපයෙන සේවාවන්ගේ ප්‍රමිතීන් පිළිබඳව හා එම ප්‍රමිතීන් අනුව සේවා සම්පාදනය නොවන්නේ නම් පුරවැසියන්/ සේවාලාභීන් විසින් ගනු ලැබිය හැකි ක්‍රියාමාර්ගයන් පිළිබඳව එකඟත්වයකට එළඹීම.
- ගෙවන බදු මුදල් වෙනුවෙන් පුරවැසියන්/ සේවාලාභීන් සඳහා ගුණාත්මක හා කාර්යක්ෂම සේවයක් සැපයීම සඳහා වන සදාචාරාත්මක බැඳීම තහවුරු කිරීම.
- සපයනු ලබන සේවාවන් විෂයයෙහි රාජ්‍ය සේවකයින්ගේ වගකීම තහවුරු කිරීම.
- නීති රෙගුලාසි හා ක්‍රමවේදයන් පිළිබඳ සේවාලාභීන් තුළ වඩා දැනුවත් භාවයක් ඇති කිරීම
- පුරවැසියන්/ සේවාලාභීන් තම සේවය ඉටු කර ගැනීමේ දී දත යුතු කරුණු පිළිබඳව අවබෝධයක් ඇති කිරීම.

## (v) 2008 - 2015 සාක් (SAARC) සමාජ ප්‍රඥප්තිය හා සම්බන්ධ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- දකුණු ආසියාවේ වෙසෙන ජනතාවගේ සුබ සාධනය ප්‍රවර්ධනය කිරීම තුළින් ජීවන තත්ත්වය නැංවීම අරමුණු කොට ඇති සාක් සමාජ ප්‍රඥප්තිය අනුව එහි සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. එහි පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීමට අදාළ රේඛීය අමාත්‍යාංශ සහ අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල සහාය ඇතිව ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධීකරණය අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් කරනු ලැබේ. නියමිත කාලසීමාවක් තුළ සපුරාගත යුතු නිශ්චිත අරමුණු සහ ඉලක්ක සමග ශ්‍රී ලංකාවට බෙහෙවින් අදාළ වන සාක් සමාජ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම මෙහි අරමුණ වේ.
- 2008 - 2015 ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත කරුණු තුළින් පහත සඳහන් අංශ කෙරෙහි අවධානය යොමු කෙරේ.

  1. දිළිඳුකම  2. තරුණයන්  3. කාන්තාවන්
  4. ළමයින්  5. අධ්‍යාපනය

- මෙම ප්‍රධාන අංශයන්ට අදාළ අමාත්‍යාංශ සමග මනා සම්බන්ධීකරණයක් ඇති කරගනිමින් ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත කරුණු ඉටු කර ගැනීම සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වනු ලැබේ.
- ක්‍රියාකාරී සැලැස්ම වඩාත් පහසුවෙන් අධ්‍යයනය කිරීම සඳහා එහි අන්තර්ගත ප්‍රගති සමාලෝචන අංග සංශෝධනය කරන ලදී.

## 6) ගරු අග්‍රාමාත්‍යතුමා නිරත වූ විදේශ සංචාර සහ ගරු අග්‍රාමාත්‍යතුමා හමුවීමට පැමිණි රාජ්‍ය තාන්ත්‍රිකයින් පිළිබඳ විස්තර

## 2013.01.01 - 2013.12.31

**බැහැදැකීම්/ සමුගැනීම් :**

| දිනය | විදේශීය රාජ්‍ය නියෝජිතයාගේ නම | රට |
|---|---|---|
| 2013.01.31 | ආර්.කේ.එම්.ඒ. රාජකරුණා මහතා, බහරේනයේ ශ්‍රී ලංකා තානාපති | ශ්‍රී ලංකාව |
| 2013.02.01 | හංගේරියාවේ ජාතික සමුළුවේ ගරු කථානායක අතිගරු ආචාර්ය ලස්ලෝ කෝවර් මැතිතුමා | හංගේරියාව |
| 2013.02.08 | ඉරානයේ ජනාධිපති උපදේශක හා ඉරානයේ ගරු තානාපතිතුමා හමුවීම | ඉරානය |
| 2013.02.20 | රුසියානු සමුහාණ්ඩුවේ තානාපති අතිගරු ඇලෙක්සැන්ඩර් කේ. කර්චාවා මැතිතුමා | රුසියානු සමූහාණ්ඩුව |
| 2013.03.14 | චින සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති අතිගරු වූ ජියැංහෝ මැතිතුමා | චිනය |
| 2013.03.14 | එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ තානාපති අතිගරු අබ්දුල්හමීඩ් ඒ.කේ. අල්- මුල්ලා මැතිතුමා | එක්සත් අරාබි එමීර් රාජ්‍යය |
| 2013.04.24 | ශ්‍රී ලංකාව වෙනුවෙන් නම්කළ මැලේසියානු මහ කොමසාරිස් අයි. අන්සර් මහතා හමුවීම | ශ්‍රී ලංකාව |
| 2013.04.24 | ශ්‍රී ලංකාවේ පිලිපීන සමූහාණ්ඩුවේ අනේවාසික තානාපති අතිගරු බහ්නරිම් අබු ගුයිනොම්ලා මැතිතුමා හමුවීම | පිලිපීනය |
| 2013.05.09 | වි. ක්‍රිෂ්ණමූර්ති මහතා, සෞදි අරාබි රාජ්‍යයේ ශ්‍රී ලංකා තානාපති | ශ්‍රී ලංකාව |
| 2013.05.09 | බංගලාදේශයේ ශ්‍රී ලංකා තානාපති අතිගරු සරත් කේ. වේරගොඩ මැතිතුමා | ශ්‍රී ලංකාව |
| 2013.05.30 | තනතුරින් ඉවත්ව යන ශ්‍රී ලංකාවේ කටාර් රාජ්‍ය තනාපති අතිගරු සාඑඩ් අබ්දුල්ලා අල්-මන්සූරි මැතිතුමා | කටාර් |
| 2013.06.19 | ඉවත්ව යන තානාපති- යුරෝපීය සංගමයේ ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික ප්‍රධානි අතිගරු බර්නාඩ් සේවගේ මැතිතුමා | යුරෝපීය සංගමය |
| 2013.07.24 | තනතුරින් ඉවත්ව යන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි ගුවන් හමුදාපති ඩබ්.ඩී.ආර්.එම්.ජේ. ගුණතිලක මහතා හමුවීම | ශ්‍රී ලංකාව |
| 2013.10.14 | ඉරාන ඉස්ලාමීය සමූහාණ්ඩුවේ ආගමික නායක උපදේශක සහ ඉරානයේ චින්තනය පිළිබඳ ඉස්ලාමීය ඉගැන්වීම් වල සබඳතාව සඳහා වන ලෝක සම්මේලනයේ මහ ලේකම් ගරු අයතුල්ලා මොහොමඩ් අලි ටෂ්කිරි මැතිතුමා | ඉරානය |
| 2013.10.22 | අතිගරු වයි. කේ. සිංහ මහතා ඉන්දියානු මහ කොමසාරිස් | ඉන්දියාව |
| 2013.10.25 | අතිගරු ඩේවිඩ් ඩැලි යුරෝපා සංගම් නියෝජිත මණ්ඩල තානාපති | යුරෝපා සංගමය |
| 2013.11.05 | මේජර් ජනරාල් ආර්.එම්.ඩී. රත්නායක මහතා හා එම පවුල | ශ්‍රී ලංකාව |

| | | |
|---|---|---|
| 2013.11.29 | අතිගරු මොන්සිග්නර් ජෝෂප් ස්පයිතෙරි, හෝලි සී තානාපතිවරයාගේ පිටත්වීම ඇපොස්තලික් නුන්සියෝ | හෝලි සී |
| 2013.12.04 | අතිගරු සුෂීල් චන්ද්‍රා අමාත්‍ය, නේපාල තානාපතිතුමා | නේපාලය |
| 2013.12.19 | අතිගරු ඉස්කෝද්ර් කෙමාල් ඔක්යාසි, තුර්කි සමූහාණ්ඩු තානාපති | තුර්කිය |
| 2013.12.23 | අතිගරු අසිසුදීන් අහමඩ්සාද ඇෆ්ගනිස්තානු ඉස්ලාමීය ජනරයේ තානාපති | ඇෆ්ගනිස්ථානය |

## ශ්‍රී ලංකාවට පැමිණි විදේශ නියෝජිතයන් :

| දිනය | විදේශීය රාජ්‍ය නියෝජිතයාගේ නම | රට |
|---|---|---|
| 2013.02.01 | ගලවා ගැනීමේ හමුදාවේ ජාත්‍යන්තර නායක ජෙනරල් ලින්ඩා බොන්ඩ් සහ ශ්‍රී ලාංකික නියෝජිතයන්<br>ගලවා ගැනීමේ හමුදාවේ 130 වන සංවත්සරය නිමිත්තෙන් නිකුත් කළ සැමරුම් මුද්දරය ගරු අගමැතිතුමා වෙත පිරිනැමීම | එක්සත් රාජධානිය |
| 2013.03.28 | අතිගරු ඩින්ග් ෂැඔෂීයැන්ග් මැතිතුමා සහ නියෝජිත පිරිස යුන්නන් ප්‍රාන්තය, චීනය | චීනය |
| 2013.08.28 | අතිගරු චුං හොං වොන්, කොරියානු සමූහාණ්ඩුවේ ගරු අග්‍රාමාත්‍යතුමා | කොරියාව |
| 2013.09.06 | කම්කරු සහ සමාජ සුබ සාධන ඇමති ගරු නසාර් අල්-රුබයේ ප්‍රධාන ඉරාන නිල නියෝජිත පිරිස | ඉරාකය |
| 2013.10.23 | හර්මන් ලෝස්ද සොයිසා කඳවුර සඳහා සාක් නිලධාරීන් හා ශිෂ්‍යභට කණ්ඩායම් සහභාගීවීම. | සාක් |
| 2013.11.05 | ගරු සේකර් ගුබාෂ්, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ කම්කරු අමාත්‍ය සහ නියෝජිත පිරිස. | එක්සත් අරාබි එමීර් රාජ්‍යය |
| 2013.11.06 | අතිගරු ජෑන් කොහොකුම් මහතා,<br>පාර්ලිමේන්තු මන්ත්‍රී චෙක් සමූහාණ්ඩුවේ විදේශ කටයුතු අමාත්‍ය සහ නියෝජිත පිරිස. | චෙක් සමූහාණ්ඩුව |
| 2013.11.25 | ගරු සහාම් බින්ග් මින්ග්, වියට්නාම් සමාජවාදී ජනරජයේ විදේශ කටයුතු අමාත්‍ය සහ නියෝජිත පිරිස | වියට්නාමය |
| 2013.11.25 | ගරු යැන්ග් ෂීකි, මහජන චීන සමූහාණ්ඩුවේ මානව සම්පත් හා සමාජ ආරක්ෂණ උප අමාත්‍ය සහ නියෝජිත පිරිස | චීනය |
| 2013.12.03 | හුනේ කිම් මහත්මිය, ආසියානු හා පැසිපික් කලාපීය ප්‍රධානී , කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල | රෝමය |

## ගරු අග්‍රාමාත්‍යතුමා සහභාගී වූ විදේශ සංචාර :

| දිනය | සංචාරය | රට |
|---|---|---|
| 2013.02.21 සිට 2013.02.25 දක්වා | ලෝක සම්මේලනය - 2013<br>විශ්ව සාම සමුළුව (ආසියාව) | කොරියාවේ සෝල් නුවර |
| 2013.06.05 සිට 2013.06.09 දක්වා | පළමු වන චීන – දකුණු ආසියාතික එක්ස්පෝ ප්‍රදර්ශනය සහ 21 වන චීන කුන්මිං ආනයන සහ අපනයන සල්පිල | චීනයේ කුන්මිං නුවර |
| 2013.08.23 සිට 2013.08.25 දක්වා | 2 වන ආසියානු යෞවන ක්‍රීඩා උළෙලේ සමාප්ති උත්සවය | චීනයේ නන්ජිං නුවර |

**ගරු අග්‍රාමාත්‍යතුමා සහභාගීවූ විශේෂ දේශීය උත්සව :**

| දිනය | උත්සවය |
|---|---|
| 2013.03.29 | 2013 දැයට කිරුළ-අම්පාර<br>චිත්‍ර හා රචනා තරගය – ත්‍යාග බෙදා දීම<br>හොඳම කුටි සඳහා ත්‍යාග ලබා දීම.<br>සමාප්ති උත්සවය |
| 2013.05.25 | සමාරම්භක උත්සවය - "ජාත්‍යාන්තර වෙසක් උත්සවය 2013" |
| 2013.08.06 | කැටයම් කලා ප්‍රධානෝත්සවය – "2012 – ශිල්ප" |
| 2013.08.12 | 2 වන දකුණු ආසියානු කලාපීය FICAL සම්මේලනය කොළඹ සිනැමන් ග්‍රෑන්ඩ් හෝටලය |
| 2013.08.30 | හිටපු ජනාධිපතිවරයෙකු වූ අතිගරු ඩී.බී.විජේතුංග මැතිතුමාගේ සහ හිටපු කැබිනට් අමාත්‍ය හා ලංකා කම්කරු කොංග්‍රසයේ නායක ගරු එස්.තොන්ඩමන් මහතාගේ පිළිරූ විවෘත කිරීම. |
| 2013.10.04 | 2014.02.04 දින පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකාවේ 66 වන නිදහස් සැමරුම් උත්සවය සංවිධානය කිරීම සඳහා වන පළමු රැස්වීම. |
| 2013.10.28 | හර්මන් ලෝස්ද සොයිසා ශිෂ්‍යභට කඳවුරේ ප්‍රධාන ආරාධිත අමුත්තා |
| 2013.10.29 | ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨයේ වාර්ෂික උපාධි ප්‍රධානෝත්සවය |
| 2013.11.25 | කොළඹ මහජන පුස්තකාල පරිශ්‍රයේ පිහිටි හෝ චි මින්ග් ප්‍රතිමාව නිරාවරණය කිරීමේ සම්භාව්‍ය අමුත්තා |

## 7) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හා රාජ්‍ය නිලධාරීන්ට සමුළු, සම්මන්ත්‍රණ, වැඩමුළු, ශිෂ්‍යත්ව සඳහා දිවයිනෙන් බැහැරව යාමට අනුමැතිය ලබාදීම

- ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ රජයේ ආයතනවල මාණ්ඩලික නිලධාරීන් විදේශ ගතවීම් වලදී රටින් බැහැරව යාම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2007 ප්‍රකාරව ගරු අග්‍රාමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගත යුතුය.

- 2013.01.01 - 2013.12.31 දින දක්වා නිලධාරීන් **6156** දෙනෙකු හට රටින් බැහැරව යාමට අනුමැතිය ලබා දී ඇත.

- මේ සම්බන්ධව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා ජනාධිපති ලේකම් කාර්යාලය විසින් වරින් වර නිකුත් කර ඇති උපදෙස් අනුව රජයේ ආයතන සමග මෙය විධිමත්ව ක්‍රියාත්මක කිරිම පිණිස අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් වරින් වර උපදෙස් නිකුත් කරනු ලැබේ. එමෙන්ම තොරතුරු ඉදිරිපත් කිරීමේ පෝරම ආදිය යථා පරිදි සකස් කොට ප්‍රමාදයකින් තොරව මෙම කටයුත්ත අදළ නිලධාරීන් වෙත ඉටුකර දීමට කටයුතු යොදා ඇත.

- ඉදිරියේදී තොරතුරු තාක්ෂණ ක්‍රම උපයෝගී කරගනිමින් අයදුම්පත් ඉදිරිපත් කිරිම හා අනුමැතිය ලබාදීමට අපේක්ෂිත අතර, එම කාර්යයන් පරිගණක ජාලය මගින් ඉටු කිරිමට අපේක්ෂා කෙරේ.

# අනුමැතිය ලබාදුන් විදේශ නිවාඩු පිළිබඳ සාරාංශය ( 2013.01.01 - 2013.12.31 )

| අනු අංකය | අමාත්‍යාංශය | අනුමැතිය ලබාදුන් නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | 1995 |
| 2 | විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශය | 450 |
| 3 | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 282 |
| 4 | පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය | 279 |
| 5 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 251 |
| 6 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 269 |
| 7 | ජලසම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය | 215 |
| 8 | ප්‍රවාහන අමාත්‍යාංශය | 144 |
| 9 | වාරි මාර්ග හා ජලකළමනාකරණ අමාත්‍යාංශය | 132 |
| 10 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 136 |
| 11 | අධ්‍යාපන අමාත්‍යාංශය | 142 |
| 12 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | 168 |
| 13 | ආපද කළමනාකරණ අමාත්‍යාංශය | 96 |
| 14 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 158 |
| 15 | සිවිල් හා ගුවන් සේවා අමාත්‍යාංශය | 150 |
| 16 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 137 |
| 17 | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | 137 |
| 18 | පශුසම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 71 |
| 19 | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය | 82 |
| 20 | විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය | 40 |
| 21 | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 51 |
| 22 | පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය | 22 |
| 23 | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු | 39 |
| 24 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 72 |
| 25 | අධිකරණ අමාත්‍යාංශය | 48 |
| 26 | සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 49 |
| 27 | තැපැල් සේවා අමාත්‍යාංශය | 51 |
| 28 | ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය | 26 |
| 29 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 11 |
| 30 | කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය | 12 |
| 31 | ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය | 14 |
| 32 | පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය | 07 |
| 33 | ක්‍රීඩා අමාත්‍යාංශය | 24 |
| 34 | ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය | 14 |
| 35 | ඛණිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය | 4 |
| 36 | සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | 22 |

| | | |
|---|---|---|
| 37 | බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 8 |
| 38 | ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය | 22 |
| 39 | සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | 17 |
| 40 | සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය | 21 |
| 41 | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 19 |
| 42 | සමාජ සේවා අමාත්‍යාංශය | 16 |
| 43 | පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය | 38 |
| 44 | ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 04 |
| 45 | රාජ්‍ය කළමණාකරන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 03 |
| 46 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 01 |
| 47 | පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 24 |
| 48 | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය | 02 |
| 49 | රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | 33 |
| 50 | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 11 |
| 51 | පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | 0 |
| 52 | මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශය | 0 |
| 53 | ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය | 54 |
| 54 | උද්භිද උද්‍යාන පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය | 36 |
| 55 | සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය | 08 |
| 56 | අධ්‍යාපන සේවා අමාත්‍යාංශය | 04 |
| 57 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 10 |
| 58 | ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | 25 |
| | මුළු එකතුව | |

## 8) අමාත්‍ය මණ්ඩල සංදේශ, පාර්ලිමේන්තු වාර්තා, ඉදිරිපත් කිරීම හා පාර්ලිමේන්තු ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම

- පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ පනත් කෙටුම්පත් ද ඇතුළුව පාර්ලිමේන්තුව හා වෙනත් ඇතැම් ආයතන වෙනුවෙන් ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සහ ගරු අග්‍රාමාත්‍යතුමා විසින් සෘජුවම ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ, අමාත්‍ය මණ්ඩලයේ ලේකම් වෙත යොමු කරනු ලැබේ.

- මෙම කටයුත්තේ දී අදාළ සංදේශ සහ ඇමුණුම් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් සකස් කිරීමත් අමාත්‍ය මණ්ඩල තීරණ ලැබුණු පසු අදාළ කාර්යාල වෙත යොමු කිරීමත් පසු විපරම් කටයුතු කිරීමත් සිදු කරනු ලැබේ.

- ගරු අග්‍රාමාත්‍යතුමා මගින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙන වාර්තා, පනත් කෙටුම්පත් ආදිය පාර්ලිමේන්තුවේ මහ ලේකම් වෙත යොමු කරනු ලැබේ. මෙහිදී නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව හා අදාළ අනෙකුත් ආයතන සමග සම්බන්ධීකරණය කර මෙම කටයුතු ඉටු කරනු ලැබේ.

- මෙයට අමතරව අතිගරු ජනාධිපතිතුමා යටතේ පවතින ආයතන හා අග්‍රාමාත්‍ය කාර්යාලයට අදාළව නගනු ලබන පාර්ලිමේන්තු ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම ද අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සිදු කරනු ලැබේ. එමෙන්ම ජාතික වශයෙන් අසනු ලබන පොදු ප්‍රශ්න හා සභාව කල් තබන අවස්ථාවේ අසනු ලබන ප්‍රශ්න ද අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සම්බන්ධීකරණය කරනු ලබයි.

# 9) තොරතුරු තාක්ෂණය හා සන්නිවේදන ප්‍රවර්ධනය

අග්‍රාමාත්‍ය කාර්යාලය *ඉ– රාජ්‍ය* ප්‍රතිපත්තියට අනුගත වීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. ඒ අනුව, පහත සඳහන් කාර්යයන් ඉටු කර ඇත.

1. තොරතුරු තාක්‍ෂණ ඒකකයක් පිහිටුවීම හා ප්‍රධාන නවීකරණ නිලධාරීන් පත් කිරීම
2. අග්‍රාමාත්‍ය කාර්යාලය සඳහා ත්‍රෛභාෂික වෙබ් අඩවිය සකස් කිරීම.
3. මෘදුකාංග ආරක්ෂිත පද්ධතියක් ස්ථාපනය කිරීම
4. ගබඩා, ප්‍රවාහන, මිලදී ගැනීම්, නිලධාරීන්ගේ පැමිණීම් පිටවීම්, පුද්ගලික ලිපි ගොනු, ස්ථාවර වත්කම් යන අංශ සඳහා පරිගණක තාක්‍ෂණය යොදා ගැනීම
5. කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ ප්‍රායෝගික පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම හා අවශ්‍ය පුහුණුව ලබා දීම
6. ආයතනයේ තොරතුරු තාක්‍ෂණ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ඒ අනුව ක්‍රියාත්මක කිරීම
7. ප්‍රධාන නවීකරණ නිලධාරීන් සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම
8. සියලුම නිලධාරීන් සඳහා පරිගණක පහසුකම් සැපයීම
9. රාජ්‍ය තොරතුරු ජාලය සඳහා ආයතනයේ සේවා සැපයීම් විස්තර ඇතුළත් කිරීම
10. සියලුම මෘදුකාංග, දෘඩාංග හා වෙබ් අඩවි සම්බන්ධ කටයුතු සඳහා බාහිර පාර්ශවයන් යොදා ගැනීමේදී ඒ සඳහා නියමිත ගිවිසුම් අත්සන් කොට ඒවා යාවත්කාලීනව පවත්වා ගෙන යාම.

මීට අමතරව ආයතනයේ අභ්‍යන්තර පරිපාලන කටයුතු සඳහා තව දුරටත් පරිගණක තාක්‍ෂණය යොදා ගැනීමට සැලසුම් කර තිබේ.

## 10) මානව සම්පත් සංවර්ධනය

අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිලධාරීන් හා සේවකයන් 80 දෙනෙකුට 2013 වසරේ දේශිය හා විදේශීය පුහුණු ලබා දී ඇත. (විදේශීය පුහුණු – 09) මෙම පුහුණුවීම් ප්‍රධාන වශයෙන් පහත සඳහන් අංශ සඳහා ලබා දී ඇත.

1. ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය කිරීම
2. පරිගණක තාක්ෂණික දැනුම වර්ධනය කිරීම
3. කළමනාකරණ විෂයන්හි දැනුම වර්ධනය කිරීම

මීට අමතරව කාර්යාලයේ සේවකයන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය කිරීම සඳහා රාජ්‍ය සේවා පුහුණු ආයතනය විසින් හදුන්වා දෙන ලද ආචාර්යවරයෙකු විසින් කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් සඳහා ඉංග්‍රීසි භාෂා පංති පැවැත්විය.

❖ එමෙන්ම වසරකට වරක් පුහුණු කටයුතු වලට අදළ ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කෙරෙන අතර එහිදී විවිධ ක්‍රියාකාරකම් තුළින් කාර්ය මණ්ඩලයේ හැකියාවන් වර්ධනය කිරීමට කටයුතු කෙරේ. මෙම වසරේ දී එම පුහුණු චාරිකාව මන්නාරම දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි ආකල්ප වර්ධන වැඩ සටහනක් ද ඇතුලත්ව ක්‍රියාත්මක කරන ලදී.

# වියදම් වාර්තාව - 2013 දෙසැම්බර්

ශීර්ෂය-2 | වැඩසටහන 1 | ව්‍යාපෘතිය-1 | ප්‍රධාන කාර්යාලය

| වැය විෂය | කාණ්ඩය | ඇස්තමේන්තුව 2013 | අතිරේක ප්‍රතිපාදන | මු.රෙ.66 මාරුකිරීම් | මුළු ඇස්තමේන්තුව | 2013 දෙසැ.31දිනට මුළු වියදම | ඉතිරිය |
|---|---|---|---|---|---|---|---|
| | පුද්ගල පඩිනඩි | | | | | | |
| 1001 | වැටුප් හා වේතන | 10,000,000 | | 393,380 | 10,393,380 | 10,393,374 | 6 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 4,500,000 | | (83,640) | 4,416,360 | 3,447,654 | 968,706 |
| 1003 | වෙනත් දීමනා | 7,500,000 | | 1,800,000 | 9,300,000 | 9,030,470 | 269,530 |
| | | **22,000,000** | | | **24,109,740** | **22,871,498** | 1,238,242 |
| | ගමන් වියදම් | | | | | | - |
| 1101 | දේශීය | 1,500,000 | | (380,000) | 1,120,000 | 1,116,749 | 3,251 |
| 1102 | විදේශීය | 4,500,000 | | (850,000) | 3,650,000 | 3,505,252 | 144,748 |
| | සැපයීම් | | | | | | - |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 2,750,000 | | 4,000,000 | 6,750,000 | 6,679,032 | 70,968 |
| 1202 | ඉන්ධන | 13,000,000 | | (695,000) | 12,305,000 | 11,691,971 | 613,029 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 200,000 | | (41,000) | 159,000 | 151,717 | 7,283 |
| | නඩත්තු වියදම් | | | | - | | - |
| 1301 | වාහන | 17,500,000 | | (6,050,000) | 11,450,000 | 11,403,295 | 46,705 |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 800,000 | | (403,500) | 396,500 | 377,646 | 18,855 |
| 1303 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 1,500,000 | | (1,210,000) | 290,000 | 276,034 | 13,966 |
| | සේවා | | | | | | - |
| 1401 | ප්‍රවාහන | 450,000 | | 10,205 | 460,205 | 460,202 | 3 |
| 1402 | තැපැල් සහ සංනිවේදන | 5,500,000 | | (1,891,900) | 3,608,100 | 3,608,059 | 41 |
| 1403 | විදුලිය සහ ජලය | 6,500,000 | | 1,616,250 | 8,116,250 | 8,116,247 | 3 |
| 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 500,000 | | (381,500) | 118,500 | 118,488 | 12 |
| 1405(1) | සංග්‍රහ සහ තෑගි | 12,000,000 | 5,000,000 | 2,952,226 | 19,952,226 | 19,952,226 | 0 |
| 1405(2) | වෙනත් | 10,123,350 | 5,000,000 | 4,289,911 | 19,413,261 | 19,413,261 | 0 |
| 1405(3) | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | 4,876,650 | | 2,818 | 4,879,468 | 4,879,468 | 0 |
| | | **81,700,000** | | | **92,668,510** | **91,749,645** | **918,865** |
| | පුනරාවර්තන එකතුව | **103,700,000** | **10,000,000** | **3,078,250** | **116,778,250** | **114,621,143** | **2,157,107** |
| | **මූලධන වත්කම් වල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | | | | | | - |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 5,000,000 | | | 5,000,000 | 2,796,250 | 2,203,750 |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,000,000 | | | 1,000,000 | | 1,000,000 |
| 2003 | වාහන | 1,000,000 | | | 1,000,000 | 647,363 | 352,638 |
| | මූලධන වත්කම් අත්පත් කරගැනීම | | | | | | - |
| 2101 | වාහන | | | | - | | - |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 5,000,000 | | | 5,000,000 | 2,432,968 | 2,567,032 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,000,000 | | | 1,000,000 | 975,200 | 24,800 |
| | මූලධන එකතුව | **13,000,000** | | - | **13,000,000** | **6,851,781** | **6,148,219** |

# වියදම් වාර්තාව - 2013 දෙසැම්බර්

**ශීර්ෂය-2** වැඩසටහන 1 **ව්‍යාපෘතිය-2** සාමාන්‍ය පරිපාලනය හා ආයතන

| විෂය | කාණ්ඩය | ඇස්තමේන්තුව 2013 | පරිපූරක ප්‍රතිපාදන | වි.රෙ.ර මාරුකිරීම් | මුළු ඇස්තමේන්තුව | 2013 දෙසැ31දිනට මුළු වියදම | ඉතිරිය |
|---|---|---|---|---|---|---|---|
| 1001 | වැටුප් හා වේතන | 35,000,000 | | -4526090 | 30,473,910 | 29,409,035 | 1,064,875 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 9,000,000 | | -326550 | 8,673,450 | 7,974,003 | 699,447 |
| 1003 | වෙනත් දීමනා | 28,500,000 | | -1800000 | 26,700,000 | 26,296,755 | 403,245 |
| | | **72,500,000** | | | **65,847,360** | **63,679,793** | 2,167,567 |
| 1101 | දේශීය | 2,000,000 | | 775290 | 2,775,290 | 2,775,289 | 1 |
| 1102 | විදේශීය | 1,500,000 | | 149,940 | 1,649,940 | 1,649,937 | 3 |
| | සැපයීම් | | | | - | | - |
| 1201 | ලිපිද්‍රව්‍යහා කාර්යාලීය අවශ්‍යතා | 2,500,000 | | 1,500,000 | 4,000,000 | 3,994,018 | 5,982 |
| 1202 | ඉන්ධන | 11,500,000 | | 691,900 | 12,191,900 | 12,191,895 | 5 |
| 1203 | නිල ඇඳුම් | 350,000 | | (25,000) | 325,000 | 323,698 | 1,302 |
| 1301 | වාහන | 9,000,000 | | (1,000,000) | 8,000,000 | 7,752,360 | 247,640 |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 900,000 | | (352,000) | 548,000 | 521,036 | 26,964 |
| 1303 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 825,000 | | (478,000) | 347,000 | 330,214 | 16,786 |
| | සේවා | | | | - | | - |
| 1401 | ප්‍රවාහන | 750,000 | | (363,000) | 387,000 | 371,400 | 15,600 |
| 1402 | තැපැල් සහ සංනිවේදන | 3,000,000 | | | 3,000,000 | 2,210,348 | 789,652 |
| 1403 | විදුලිය සහ ජලය | 10,000,000 | | (671,050) | 9,328,950 | 8,914,011 | 414,939 |
| 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 500,000 | | 120,000 | 620,000 | 619,890 | 110 |
| 1405 | වෙනත් | 6,500,000 | | 1,651,610 | 8,151,610 | 8,147,320 | 4,290 |
| 1506 | දේපළ හා ණය පොලී | 800,000 | | 550,000 | 1,350,000 | 1,316,127 | 33,873 |
| 1701 | පාඩු හා කපා හැරීම් | | | 1,024,700 | 1,024,700 | 1,024,663 | 37 |
| | | **50,125,000** | | | **52,674,690** | **52,142,207** | 532,483 |
| | **මුළු එකතුව** | **122,625,000** | | **(3,078,250)** | **118,522,050** | **115,822,000** | **2,700,050** |
| | මූලධන වියදම් | **මූලධන වත්කම් වල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | | | | | - |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 10,000,000 | | | 10,000,000 | 9,962,898 | 37,102 |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 500,000 | | | 500,000 | | 500,000 |
| 2003 | වාහන | 500,000 | | | 500,000 | 11,733 | 488,267 |
| 2101 | වාහන | | | | - | | - |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 3,000,000 | | | 3,000,000 | 1,163,490 | 1,836,510 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 3,600,000 | | | 3,600,000 | 45,200 | 3,554,800 |
| 2104 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 35,000,000 | | | 35,000,000 | 33,118,675 | 1,881,325 |
| | මානව සම්පත් සංවර්ධනය | | | | | | - |
| 2502 | ආකල්ප වර්ධන වැඩසටහන | 30,000,000 | | | 30,000,000 | 21,030,370 | 8,969,630 |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 800,000 | | | 800,000 | 744,045 | 55,955 |
| | **මුළු එකතුව** | **83,400,000** | | | **83,400,000** | **66,076,412** | **17,323,588** |